2.5 උසස්වීම් ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ සිදු කරනු ඇත.

2.6 මෙම පත්වීම් ශ්‍රී ලංකා ගුරු සේවයේ මාරු කිරීමේ පටිපාටියේ සඳහන් විධිවිධාවලට යටත්ය.

3. *අයදුම්කිරීමේ ක්‍රමය* :

3.1 අයදුම්පත්‍රය මෙම නිවේදනයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව විය යුතු අතර ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් සකස් කර අපේක්ෂකයා විසින්ම පිරවිය යුතුය.

3.2 නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2014.07.18 වැනි දිනට හෝ ඊට පෙර "ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ "ශාරීරික අධ්‍යාපන විෂයය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3-1 ශ්‍රේණියට බඳවා ගැනීම" ලෙස අනියාවාර්යයෙන් ම සඳහන් කළ යුතුය.

4. අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලැබේ. තැපැලේදී නැතිවන අයදුම්පත් පිළිබඳව වගකීම අමාත්‍යාංශය භාරගනු නොලැබේ.

5. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

6. මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට හා අදාළ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. දැනටමත් සේවයේ යෙදී සිටින අයදුම්කරුවන් තම ආයතන ප්‍රධානියා මගින් සහතික කරන ලද අයදුම්පත් ඉදිරිපත් කිරීම කළ යුතුවේ.

8. මෙම නිවේදනයේ ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම පිළිබඳ අවසන් තීරණය ගැනීමේ අයිතිය ද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

### උපලේඛනය අංක 1

ක්‍රීඩා විෂයයට අනුව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ලබා දෙනු ලබන මාතෘකාවකට අදාළව විනාඩි 5 ක ඉදිරිපත් කිරීමක් කළ යුතුය.

| *ලකුණු ලබා දීමේ පටිපාටිය* | *ලකුණු* |
|---|---|
| අරමුණ/පාඩමට පිවිසීම | 10 |
| ළමයාගේ අවධානය යොමු කිරීමට ගන්නා උත්සාහය | 10 |
| අරමුණ සපුරා ගැනීම | 10 |
| හඬ පාලනය පෙනුම අංගචලනය හා පෞරුෂත්වය | 10 |
| කාලකළමනාකරණය | 10 |
| මුළු ලකුණු | 50 |

**විශේෂ කුසලතා**

| | |
|---|---|
| අන්තර්ජාතික හා සමස්ථ ලංකා ක්‍රීඩා කුසලතාවය | 30 |
| අනෙකුත් ක්‍රීඩා කුසලතාවයන් | 20 |

*සටහන*.- ක්‍රීඩා කුසලතා සලකා බැලීමේදී කොට්ඨාස කලාප සහ පළාත් මට්ටමේ ක්‍රීඩා කුසලතා පමණක් සලකා බලනු ලබයි.

මුළු ලකුණු සංඛ්‍යාව 100 කි.

අනුර දිසානායක,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2014 ජූලි මස 04 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

### ආදර්ශ අයදුම් පත්‍රය

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා : [ ]

***ශාරීරික අධ්‍යාපන විෂයය සඳහා ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පංතියේ I ශ්‍රේණියට උපාධිධාරි ගුරුවරුන් බඳවා ගැනීම - 2014***

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) (උදා : PERERA, A. B. ) :—————.

1.1.1 මුලකුරු සමග නම (සිංහලෙන්) :—————.

1.2 මුලකුරුවලින් දැක්වෙන නම් (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.

1.2.1 මුලකුරුවලින් දැක්වෙන නම් (සිංහලෙන්) :—————.

02. වර්තමාන ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.

2.1 වර්තමාන ලිපිනය (සිංහලෙන්) :—————.

2.2 ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:—————. පළාත :—————.

3. ස්ත්‍රී/පුරුෂ භාවය (ස්ත්‍රී - 1 පුරුෂ 0) [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.1 උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.2 2014.07.18 දිනට වයස :

අවු : [ | ] මාස : [ | ] දින : [ | ]

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

3.4 දුරකථන අංකය (ජංගම) :—————.

3.5 ඊ මේල් ලිපිනය :—————.

04. *අධ්‍යාපන සුදුසුකම් පිළිබඳව විස්තර* :

4.1 *අ.පො.ස. (සා. පෙළ) විභාගය* :

වර්ෂය :—————. විභාග අංකය :—————.

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1 ———— | ———— | 5 ———— | ———— |
| 2 ———— | ———— | 6 ———— | ———— |
| 3 ———— | ———— | 7 ———— | ———— |
| 4 ———— | ———— | 8 ———— | ———— |

4.2 *අ.පො.ස. (උ.පෙළ) විභාගය ඃ*

*වර්ෂය* :————. *විභාග අංකය* :————.

| *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|
| 1 ———— | ———— |
| 2 ———— | ———— |
| 3 ———— | ———— |
| 4 ———— | ———— |

05. *උසස් අධ්‍යාපන සුදුසුකම් ඃ*

5.1 ලබා ඇති උපාධිය :————.

5.2 විශ්ව විද්‍යාලය :————.

5.3 උපාධිය වලංගු වන දිනය :————.

5.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් ඃ

| |
|---|
| |
| |
| |
| |

5.5 උපාධිය ලබා ඇති මාධ්‍යය :————.

5.6 වෙනත් ඉහළ අධ්‍යාපන සුදුසුකම් :————.

5.7 අන්තර්ජාතික හා සමස්ථ ලංකා ක්‍රීඩා කුසලතා :————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බව මම දනිමි. මෙහි සඳහන් කිසිම තොරතුරක් පසුව වෙනස් නොකරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06. *අයදුම්කරුගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.-*

................. මහත්මයා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත් මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

දිනය :————.
තනතුර :————.
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව :————.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ
බලය පවරනු ලැබූ නිලධාරියා

07-156

---

සංශෝධනයයි

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**

පොලිස් ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය

**කාන්තා උපපොලිස් පරීක්ෂක තනතුර හා කාන්තා පොලිස් කොස්තාපල් තනතුර - (සාමාන්‍ය)**

2014.04.11 දින පළවූ අංක 1858 දරන ගැසට් පත්‍රයේ I කොටස ඃ II(අ) ඡෙදය තනතුරු ඇබෑර්තු යටතේ පළවූ ඉහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2014.07.31 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

පොලිස්පති.

2014 ජූනි මස 18 වැනි දින,
කොළඹ 01
පොලිස් මූලස්ථානයේ දී ය.

07-85

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**

කතෝලික දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2013

**ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය**

01. කතෝලික යොවුන් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය ලෙස හඳුන්වනු ලබන මෙම විභාගය 2014 ඔක්තෝබර් මාසය තුළ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

02. *විභාග මධ්‍යස්ථානය.-* දිවයින තුළ සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන ලෙස අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ඇත. එහෙත් යම් මධ්‍යස්ථානයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි විභාග මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට සිදුවනු ඇත. විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන දිස්ත්‍රික්ක හා නගර දැක්වෙන ලැයිස්තුව I වැනි උපලේඛනයේ දක්වා ඇත.

